## පස්ගොඩ ප්‍රාදේශීය සභාව

## මාතර දිස්ත්‍රික්කය

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 17 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 මාර්තු 28 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2011 සහ 2012 වර්ෂවලදී පස්ගොඩ වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා රු.3,326,305 ක මුදලක් හා, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා රු.1,120,693 ක මුදලක්, ගෙවා තිබුණද, එම වියදම සමාලෝචිත වර්ෂය අවසානයට ශේෂ පත්‍රයේ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම තුල දක්වා නොතිබුණි.

(ආ) මුද්දර ගාස්තු ලේඛණය අනුව සමාලෝචිත වර්ෂය සඳහා රු.4,287,012 ක් මුද්දර ගාස්තු ආදායම් වශයෙන් ලැබී තිබුණද ආදායම් වියදම් ගිණුමේ වෙනත් ආදායම් ලෙස බැර කර තිබුනේ රු.2,800,000 ක මුදලක් පමණක් වූයෙන් වෙනස රු.1,487,012 ක් විය.

(ඇ) 2012 ජනවාරි 01 දිනට ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර මුදල රු.26,123,666 ක් ලෙස ප්‍රධාන ලෙජරයෙහි දක්වා තිබුණද, 2011 සහ ඊට පෙර වර්ෂ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.30,684,940 ක මුදලක් ලැබී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂවලට අදාලව ලැබී තිබුණු රු.4,561,274 ක මුදල අදාල ගිණුම් සමග ගැලපුම් නොකොට සමාලෝචිත වර්ෂයේ ආදායමට බැර කර තිබුණි.

(ඈ) 2012 දෙසැම්බර් 31 දිනට ආයුර්වේද ගබඩා තොගයේ වටිනාකම රු.71,833 ක් වුවද ශේෂ පත්‍රයේ එකී තොගයේ වටිනාකම රු.125,905 ක් ලෙසට දක්වා තිබුණෙන් වෙනස රු.54,072 ක් විය.

### 1.3.2 නිරවුල් නොවූ ගිණුම්

ඉකුත් වර්ෂවල සිට ඉදිරියට එමින් පවතින නිරවුල් නොකළ ගිණුම් ශේෂයන්ගේ හර එකතුව රු.490,376 ක් වූ අතර, බැර ශේෂයන්ගේ එකතුව රු.1,267,570 ක් විය.

### 1.3.3 නොසැසඳු පාලන ගිණුම්

පාලන ගිණුම් 05 ක ලෙජරය අනුව වටිනාකම රු.85,771,135 ක් වූ අතර, උපයෝගී ලේඛණ අනුව වටිනාකම රු.35,770,834 ක් වූයෙන් වෙනස රු.50,000.301 ක් විය.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා රු. 50,128,264 ක් වූ ගිණුම් ශේෂයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,135,820 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 9,056,128 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත<br>රු.000' | තථ්‍ය<br>රු.000' | දෙසැම්බර් 31 දිනට හිඟය<br>රු.000' |
|---|---|---|---|---|
| (i) | අක්කර බදු | 124 | 81 | 43 |
| (ii) | බදු කුලී | 3,756 | 3,768 | 12 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 967 | 725 | 242 |
| (iv) | වෙනත් ආදායම් | 22,627 | 16,063 | 5,563 |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.754,517 හා මුද්දර ගාස්තු රු.5,682,726 ක් විය.

### 2.2.3 ප්‍රචාරක දැන්වීම්

2012 වර්ෂයේ ආදායම් ලේඛණය අනුව ප්‍රදර්ශනය වෙමින් පැවති ප්‍රචාරක දැන්වීම් 101 කින් රු.31,800 ක මුදලක් අයකර ගෙන නොතිබුණි.

### 2.2.4 වෙළඳ බලපත්‍ර ගාස්තු

2012 ආදායම් ලේඛණය අනුව වෙළඳ බලපත්‍ර ගාස්තු අයවිය යුතු ව්‍යාපාරික ස්ථාන 787 කින් රු.35,865 ක් 2013 නොවැම්බර් මස 01 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

2.2.5 විදුලි සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු

------------------------------------

(අ) 2012 වර්ෂය සඳහා විදුලි සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු අය කිරීමේදී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය යටතේ පෙර වර්ෂයේ ලැබීම් මත ගාස්තු අය කිරීමට සභාව තීරණය කර තිබුණි. ව්‍යාපාරයේ ආදායම අනුව විදුලි සම්ප්‍රේෂණ කුළුණු වලින් ගාස්තු අයකරන ක්‍රමවේදය පිළිබඳව හඳුන්වාදීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයට අදාලව 2012 ජනවාරි 13 දිනැති ගැසට් නිවේදනය අනුව කුළුණු වලින් ගාස්තු අය කිරීමට තීරණය කළද, සභා බල ප්‍රදේශයේ සම්ප්‍රේෂණ කුළුණු 12 කින් එකී වර්ෂය වෙනුවෙන් කිසිදු මුදලක් අයවී නොතිබුණි.

2.3 වීථි පහන් නඩත්තුව

----------------------------

(අ) 2010 අගෝස්තු 17 දිනැති අංක පීඊ/01/01 හා 2010 අංක 17 දරන විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ පළාත් පාලන ආයතන බල ප්‍රදේශ ආලෝකරණය චක්‍රලේඛයේ 12 ඡේදය ප්‍රකාරව වාර්ෂික ගෘහස්ථ හා පොදු කාර්යය සිල්ලර පාරිභෝජනයෙන් 3%ක් ඇස්තමේන්තුගත වීථි ලාම්පු විදුලි පාරිභෝජනය සඳහා වෙන්කර ගත හැකි වුවද ඒ පිළිබඳ සභාවේ අවධානය යොමු වී නොතිබුණි. සභාවට අයකර ගත යුතු රු.90,936 ක මුදලක් විදුලි බල මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(ආ) ඉහත (අ) හි සඳහන් චක්‍රලේඛයේ පරිදි සියළුම වීථි පහන් සවිකිරීම් සඳහා විදුලි බල මණ්ඩලයේ ලිඛිත අනුමැතිය ලබා ගත යුතු වුවද සභාව වීථි පහන් ලේඛණය විධිමත් පරිදි නඩත්තු නොකිරීම නිසා අනුමත වීථි පහන් සංඛ්‍යාව විගණනයට අනාවරණය කරගත නොහැකි විය.

2.4 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

-------------------------------------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය ප්‍රකාරව උත්සව පැවැත්වීම සඳහා ප්‍රාදේශීය සභා අරමුදලින් වසරකට ගෙවිය යුතු උපරිම වටිනාකම රු.1,000 ක් වුවද එම මුදල ඉක්මවා උත්සව වෙනුවෙන් රු.33,414 ක මුදලක් සභාව වැයකර තිබුණි.

2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) 2005 මාර්තු 31 දිනැති අංක 08/2005 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 11.5 ඡේදය අනුව දේපල ණය සඳහා බැංකු පොලී අනුපාතය හා නිලධාරීන්ගෙන් අයකරනු ලබන සියයට 4 ක පොලී අනුපාතය අතර වෙනස රජය මගින් ප්‍රතිපූර්ණය කළ යුතුය. එසේ වුවද ඉකුත් වර්ෂ හා සමාලෝචිත වර්ෂය සඳහා සභා අරමුදලින් ගෙවන ලද රු.46,000 ක මුදලක් 2012 දෙසැම්බර් 31 දිනටද ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(ආ) 1993 සැප්තැම්බර් 03 දිනට ප්‍රථම විශ්‍රාම ගන්වන ලද පළාත් පාලන සේවයේ සේවකයන්ගේ විශ්‍රාම වැටුප් පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලින් ගෙවනු ලබන අතර එම නිලධාරියා සේවය කළ පළාත් පාලන ආයතන වලින් ඔහුට ගෙවන ලද වැටුප් පදනම් කරගෙන සියයට 85 , සියයට 70 හා සියයට 55 යන ප්‍රතිශත යටතේ මාසිකව එකී අරමුදල වෙත ප්‍රේෂණය කළයුතු වුවද ප්‍රාදේශීය සභාව 2012 දෙසැම්බර් 31 දිනට එකී අරමුදල වෙත ප්‍රේෂණය කළයුතුව තිබුණු රු.1,508,258 ක මුදලක් එසේ ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ) 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 20 වගන්තිය පරිදි පළාත් පාලන ආයතනයන්ට ගෙවනු ලබන ප්‍රදාන වලින් එම හිඟහිටි මුදල අඩුකර ගැනීමට ප්‍රතිපාදන ඇති නමුත් පළාත් සභා විසින් එම හිඟහිටි මුදල් අයකර ප්‍රේෂණය නොකිරීම නිසා අරමුදල යටතේ විශ්‍රාම වැටුප ගෙවනු ලබන නිලධාරීන්ට ගෙවීම් කිරීමට නොහැකි වී තිබුණි.

## 2.6 අභ්‍යන්තර විගණනය

සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක වී නොතිබු අතර සමාලෝචිත වර්ෂයේ විගණනය හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි

## 3. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය